# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2276/86 – 2022 අප්‍රේල් මස 23 වැනි සෙනසුරාදා – 2022.04.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිගම්පල් කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 100බී, සියඹලාවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, සියඹලාවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KE/RWN/2019/128 හා 2019.10.09 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – පීටර්හිල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0026**

උතුරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය, පීටර්හිල්වත්ත සහ කැබලි අක්ෂර B; දකුණට: පීටර්හිල්වත්ත සහ කැබලි අක්ෂර B; බටහිරට: පීටර්හිල්වත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා).

02. **කැබලි අක්ෂර 'B' – පීටර්හිල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0216**

උතුරට: පීටර්හිල්වත්ත, කැබලි අක්ෂර A සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ පීටර්හිල්වත්ත; දකුණට: පීටර්හිල්වත්ත සහ ජම්බුගහහේනවත්ත; බටහිරට: කැබලි අක්ෂර C සහ පීටර්හිල්වත්ත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2017/WS/83.
2021 සැප්තැම්බර් මස 01 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0158